# වලපනේ කීර්තිබණ්ඩාර දේවාලයේ ඓතිහාසික පසුබිම සහ එහි වත්මන් ස්වභාවය පිළිබඳව විමර්ශනාත්මක අධ්‍යයනයක්

බී.එම්.එල්.එස්.කේ. බස්නායක

සමාජවිද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
lakshikasudarshanils@gmail.com

**මුඛ්‍ය පද** - ඓතිහාසික, කීර්තිබණ්ඩාර, දේවාලය, වලපනේ

## හැඳින්වීම

නුවරඑළිය දිස්ත්‍රික්කයට අයත් වලපනේ නගරයේ සිට කිලෝ මීටර් 11ක් දුරින් කීර්තිබණ්ඩාරපුර පොලිස් මුරපොල ආසන්නයේ ප්‍රධාන මාර්ගයට මුහුණලා ඓතිහාසික කීර්තිබණ්ඩාර දේවාලය පිහිටා තිබේ. කීර්තිබණ්ඩාර දෙවියන්ගේ අඩවිය ලෙසින් මෙම ප්‍රදේශය ප්‍රචලිතය. පියසේන කහඳගම විසින් රචිත මා දුටු බින්තැන්න කෘතියේ ප්‍රාදේශීය දෙවියෙකු ලෙස කීර්තිබණ්ඩාර දෙවියන් පිළිබඳ සඳහන් කරයි. ඓතිහාසික වැදගත්කමින් යුත් කීර්තිබණ්ඩාර දේවාලයේ ඓතිහාසික පසුබිම සහ එහි වත්මන් ස්වභාවය කුමක්ද යන පර්යේෂණ ගැටලුව ඔස්සේ මෙම පර්යේෂණය සිදු කෙරිණි. ඓතිහාසික කීර්තිබණ්ඩාර දේවාලයේ ඓතිහාසික පසුබිම සහ එහි වත්මන් ස්වභාවය හඳුනා ගැනීම මෙහි ප්‍රධාන අරමුණ බවට පත්විය. කීර්තිබණ්ඩාර දෙවියන් හා බැඳි ඓතිහාසික කතා පුවත හඳුනා ගැනීම, වර්තමානයේ දේවාලය හා බැඳි ගැටලු හඳුනා ගැනීම අනු අරමුණු අතර විය.

## ක්‍රමවේදය

පර්යේෂණ ක්‍රමවේදය ලෙස සම්මුඛ සාකච්ඡා ක්‍රමය ප්‍රධාන ලෙසම භාවිත කෙරිණි. ඓතිහාසික කීර්තිබණ්ඩාර දේවාලයේ පරම්පරානුගතව පැරණිම සහ වත්මන් ප්‍රධාන කපුමහතා වන ජී.එම්. මුතුබණ්ඩා සමග සම්මුඛ සාකච්ඡා පවත්වා තොරතුරු රැස් කෙරිණි. පර්යේෂණ ක්ෂේත්‍රය වූ කීර්තිබණ්ඩාර දේවාල පරිශ්‍රය සෘජු නිරීක්ෂණයට ලක් කරමින් ප්‍රාථමික දත්ත ලබා ගැනුණි. කීර්තිබණ්ඩාර දෙවියන් සහ දේවාලය පිළිබඳව සිදු කළ පර්යේෂණයක් නිසා ගුණාත්මක ලෙස දත්ත රැස් කිරීම සිදු විය.

## ප්‍රතිඵල සහ සාකච්ඡාව

ඓතිහාසික කීර්තිබණ්ඩාර දෙවියන් හා බැඳි ඓතිහාසික කතා පුවත මෙහි දී හඳුනාගත හැකි විය. "කීර්ති ශ්‍රී රාජසිංහ රජුට කීර්තිබණ්ඩාර හා බිසෝබණ්ඩාර නමින් දරුවන් දෙදෙනෙකි. කුලහැලයා හා මහහැලයා ලෙස අතවැසියන් දෙදෙනෙකු ද වේ. ඔවුනට කීර්තිබණ්ඩාර කුමරු ගල්කැට ගසා හිරිහැර කරයි. මේ නිසා කුලහැලයා හා මහහැලයා මාලිගයේ උයනේ මල් සියල්ල කඩා කීර්තිබණ්ඩාර කුමරුන් එය සිදු කළ බව පිය රජුට දන්වයි. කෝපයට පත් රජු තම පුත් කුමරු මාලිගයෙන් පිටුවහල් කරයි. කුමරුන් දළදාවීදිය, පේරාදෙණිය, බූවැලිකඩ, ඉලුක්නුවර, තැන්නේකුඹුර, බෙලිහුල්ඔය, කටුපත්වල, දැවගම්මන පසු කරමින් කුරුදු ඔය ආසන්නයට පැමිණේ. එන අතර වාරයේ තැන්නේකුඹුර, කටුපත්වල, හකුරුතලේ, බෙලිහුල්ඔය, බොලගන්දාව ආදී ප්‍රදේශවල වෙල්යායවල් අස්වද්දයි. නමුත් පිය රජු අස්වැද්දූ වෙල් සියල්ල අත්පත් කර ගනී. අවසානයේ කුරුදු ඔයෙන් ඇල මාන බලාලා දාසය අමුණක වෙලක් එනම් පුස්සල කඳුරු ඔය වෙල අස්වද්දයි. වගා කිරීමට වී නොමැතිව අසල ගමක ගෙවල් පහකින් වී ඉල්ලයි. මහල්ලෙකු වී නොමැති බවත් බොල් වී පවතින බවත් පවසා ඇත. ඒවා ලබා ගත් කුමරුන් අස්වැද්දූ වෙලෙහි බොල් වී ඉස ඇත. කුමරුන්ගේ පින් මහිමයට බොල් වී වලින් රන්මුසු පැලවේ. මෙය දැනගත් පිය රජු තම කලු ඇතින්න සරසවා පිරිවර සහිතව විත් අස්වැද්දූ වෙල ඉල්ලයි. අසල පැවති අරාගල කන්දේ ගලක් පෙන්වා එම ගලෙන් පහළට දැමූවත් වෙල නොදෙන බව කීර්තිබණ්ඩාර කුමරු පවසා ඇත. ඒ අනුව එම ගලෙන් ම පහළට තල්ලු කර කුමරු මරා දැමීමට රජු නියම කරයි. අසල පැවති

තැනිතලාවක දී කුමරු මිනි ඇඳුමෙන් සරසා ඇත. එලෙස කුමරු සැරසූ තැන්න සැරසුණුතැන්න බවට පත් විය. කුමරුන් ගලෙන් පහළට තල්ලු කරන්නට පැමිණි වාධකයන් දෙදෙනාත් අල්ලා ගනිමින් කුමරු ගලෙන් පහලට පනී. වදකයන් දෙදෙනා වටයන් වූ අතර කුමරු පින් මහිමයෙන් දේවත්වයට පත්ව රජු පැමිණි කලු ඇතින්න ගල් කරවා පිය රජුට නැවත මාලිගාවට යාමට නොදෙයි. මෙම ස්ථානයේ වාර්ෂිකව දේවදාන, අඩුක්කු මංගල්‍යය, ගම්මඩු තේවාවන්, අලු මංගල්‍යය හා පෙරහැර කරන බවට රජු ඉනේ බැඳ සිටි රන් පටිය අසල තිබූ තෙලඹු ගසේ බැඳ පොරොන්දු කරවා ගනී. ඒ අනුව එම ස්ථානයේ රජු විසින් කීර්තිබණ්ඩාර දෙවියන් වෙනුවන් දේවාලයක් ඉදි කරනු ලබයි. එය එක්අස්ස දේවාලය නමින් හඳුන්වා තිබේ (මුතුබංඩා, 1953).

මෙම දේවාලය මහවැලි ව්‍යාපාරය යටතේ නිර්මාණය කළ රන්දෙණිගල ජලාශ්‍රයේ ඉදිකිරීම් කටයුතුවලට යටවීමට යන අතර අවස්ථා කිහිපයක දී ජලාශයේ ඉදිකිරීම් කටයුතුවලට බාධා මතු වේ. මේ නිසා පැවති රජය විසින් ජලාශයට යට වන දේවාලය වෙනුවට නව දේවාලයක් නිර්මාණය කර දෙන බවට බාරහාර වී එවකට ජනාධිපති ජේ.ආර්. ජයවර්ධන මහතාගේ මෙහෙයවීම යටතේ වලපනේ සිට මහනුවර දක්වා දිවෙන මාර්ගයේ කිලෝ මීටර් 11ක් ගිය විට ප්‍රධාන මාර්ගයට මුහුණලා නව දේවාලයක් ඉදි කර 1986 අගෝස්තු මස 30 වෙනි දින ඓතිහාසික කීර්තිබණ්ඩාර දේවාලය නමින් එය විවෘත කර තිබේ.

එක්අස්ස දේවාලයෙන් දේව පිළිම සහ දේව ආයුධ ලබා ගැනීමට යාමේ දී කළු දෙබරුන් මතු වී ඊට බාධා කළ බවත් මහත් ශ්‍රමයකින් අනතුරුව ඒවා ලබා ගත් බවත් රන් පටිය බැඳි තෙලඹු ගස රන්දෙණිගල ජලාශයට යට වූ බවත්, බදාදා, සෙනසුරාදා, ඉරිදා ආදී කෙම්මුර දිනයන් හිදී ඒ ආසන්නයෙන් යන විට දේවාලයේ හඬ ඇසෙන බවත් මුතුබණ්ඩා මහතා අනාවරණය කළේය.

ඓතිහාසික කීර්තිබණ්ඩාර දේවාලයේ වර්තමානයේ කපු මහතුන් හය දෙනෙකු සේවය කරයි. කීර්තිබණ්ඩාර දෙවියන් වෙනුවෙන් නිර්මාණය කළ දේවාලය, බුදු පිළිමය, තෙලඹු ගසක්, දේව පිළිම හා දේව ආයුධ, කීර්ති ශ්‍රී රාජසිංහ රජු හා කලු ඇතින්නගේ අනුරුවක්, සණ්ඨාර කුළුණ, දොලොස් මහේ පහන, දේවාලයට අයත් ගොඩනැගිල්ලක් සහ කලු කුමාර දේවාලයක් මෙහි දැකගත හැකි විය. දේවාලය විසින් ආසන්නයේ පවතින වෙලක වාර්ෂිකව ගම්මඩු, අඩුක්කු, අලුත්සහල් මංගල්‍ය ආදීය සිදු කරනු ලබයි. දේවාලයේ භාරකාරීත්වය හා කපු මහතුන් පරම්පරාවෙන් පැවත එන්නකි.

ඓතිහාසික කීර්තිබණ්ඩාර දේවාලය අයත් ඉඩම වර්තමානයේත් දේවාලගම්වලට පවරා නැත. දේවාලයට අයත් පඬුරු පෙට්ටියක් දේවාලය ඉදිරිපිට ප්‍රධාන මාර්ගය ආසන්නයේ තබා ඇති අතර ඉන් 5% ක මුදලක් පමණක් දේවාලයට ලබා දී අනිකුත් මුදල් රජය විසින් ලබා ගෙන තිබේ. මුල්කාලීනව 10% ක මුදලක් ලබා දී ඇතත් වලපනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හරහා කීර්තිබණ්ඩාර දේවාල පෙරහැර ආරම්භ කිරීමත් සමග ඉන් 5% ක මුදලක් කප්පාදු කර ඇත. මුල් කාලයට සාපේක්ෂව වර්තමානයේ දේවාලයට පැමිණෙන පිරිස තරමක් දුරට අඩු වී තිබෙන බවත් කිසිදු සංරක්ෂණයක් සිදු නොවන බවත් කපුමහතා විසින් අනාවරණය කෙරිණි. ඓතිහාසික කීර්තිබණ්ඩාර දේවාලය ඓතිහාසිකමය වැදගත්කමකින් යුක්ත දේවාලයක් වන බව අවසානයේ නිගමනය කළ හැකිය.

**ආශ්‍රිත මූලාශ්‍රය**

පියසේන, කේ. (2008). මා දුටු බින්තැන්න, ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ 11.

ජී.එම්. මුතුබණ්ඩා, (අවු. 73), 2023.06.29